SRI LANKA

**ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය**

## අදියර II විභාගය - 2023 ජුලි

## යෝජිත උත්තර

# (203) ව්‍යාපාර නීතිය (BLA)


**ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය**

නො. 540, පූජ්‍ය මුරුත්තෙට්ටුවේ ආනන්ද නාහිමි මාවත,

නාරාහේන්පිට, කොළඹ 05.

දුරකථන: 011-2-559 669



**මෙය අධ්‍යාපන හා පුහුණු කිරීම් අංශයේ ප්‍රකාශනයකි**

ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

අදියර II විභාගය - 2023 ජුලි

# (203) ව්‍යාපාර නීතිය

# යෝජිත උත්තර

(මුළු ලකුණු 25) **A කොටස**

## *පළමුවන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තරඃ*

**1.1** (2)

**1.2** (3)

**1.3** (4)

**1.4** (3)

**1.5** (1)

**1.6** (4)

***(එක් කොටසකට ලකුණු 02, මුළු ලකුණු 12)***

**1.7** සත්‍යයි

**1.8** අසත්‍යයි

**1.9** සත්‍යයි

***(එක් කොටසකට ලකුණු 01, මුළු ලකුණු 03)***

**1.10** *පහත ඒවායින් 2ක්*

- බිල්පත සඳහා ගෙවීම් වටිනාකම ලබාගැනීම
- බිල්පතෙහි වටිනාකම පූර්ණය කිරීමට පූර්ව පාර්ශ්වයන් සඳහා නඩු පැවරීමට හැකිය
- සාකච්ඡා මාර්ගයෙන් ශීර්ෂය පැවරීමට/මාරුකිරීමට හැකිය

**1.11** *පහත ඒවායින් 2ක්*

- හදුනාගත් භාණ්ඩ සුවිශේෂීකර දැක්වීම
- භාණ්ඩයේ අඩංගු දේ, ප්‍රමාණය , බර
- භාණ්ඩයේ ගුණාත්මකභාවය

**1.12** *පහත ඒවායින් 2ක්*

- මුදල් ඇණවුම
- තැපැල් ඇණවුම
- ස්ථාවර තැන්පතු සහතික
- කොටස් සහතික
- ණයවර ලිපිය
- නෞභාර පත්‍රය
- තැන්පතු සහතිකය

**1.13** *පහත ඒවායින් 2ක්*

- ගිවිසුමහි ප්‍රතිෂ්ඨාව ස්ථාවර වියයුතුය
- ගිවිසුමේ පරිදි මිල ගණනය කිරීම
- පාර්ශ්වයන් අතර ගනුදෙනුව සිදුවන ක්‍රමය මත ප්‍රතිෂ්ඨාව තීරණය කිරීම
- සාධාරණ ප්‍රතිශ්ඨාව

**1.14** *පහත ඒවායින් 2ක්*

- බදු අයිතිය
- සංක්‍රාන්තිය නතරකිරීමේ අයිතිය
- නැවත විකිණීමේ අයිතිය

aat SRI LANKA

***(එක් කොටසකට ලකුණු 02, මුළු ලකුණු 10)***

***(මුළු ලකුණු 25)***

***A කොටසෙහි අවසානය***

**(මුළු ලකුණු 50 යි)** | **B කොටස**

## *දෙවන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තරඃ*

***පරිච්ඡේදය 08 - රක්ෂණ නීතිය, කල්බදු හා ලීසිං***

**(a)**

රක්ෂණ ගිවිසුම්ය උපරිම විශ්වාසයේ (***Uberrimae fidei***) මූලධර්මය මත පදනම් වූ ගිවිසුම් වේ. රක්ෂණ ගිවිසුමේ අනෙක් පාර්ශවයන්ට රක්ෂණය ගිවිසුමට එළඹීම හෝ නොඑළෙඹීම පිළිබද තීරණයක් ගැනීම සදහා වැදගත්වන්නා වූ සියලු තොරතුරු රක්ෂණ ගිවිසුමට ඇතුලත්වීමට ප්‍රථම හෙළිකිරීමට රක්ෂණ ගිවිසුමක සෑම පාර්ශවයකටම වගකීමක් ඇත. කිරීමට. මෙම රක්ෂණ මූලධර්මය රක්ෂණ ගනුදෙනුවකට සම්බන්ධ පාර්ශවයන්ගේ සත්‍යවාදී බව පිළිබදව සහතිකයක් සපයයි. රක්ෂණ ගිවිසුමකට එළඹීමේදී යම් වැදගත් කරුණක් අනාවරණය කිරීමට රක්ෂිතයා අසමත් වීම රක්ෂණ ගිවිසුම අවලංගු කිරීමට හේතු වේ. ගිවිසුමක වැදගත් කරුණු පිළිබදව සිදු කරනු ලබන අවනිදේශනයක් එකී ගිවිසුම සම්බන්ධ උපරිම විශ්වාසය බිදවැටීමට හේතු වේ. එවැන්නක් මත රක්ෂණ සමාගමට ප්‍රතිලාභ ගෙවීම ප්‍රතික්ෂේප කළ හැකිය

ප්‍රශ්නගත කරුණු අනුව, රක්ෂණ ඔප්පුව ලබා ගන්නා අවස්ථාවේදී වලිමුණි ඔහුගේ සෞඛ්‍ය තත්ත්වය පිළිබඳ සත්‍ය කරුණු රක්ෂණ සමාගමට හෙළි නොකළ බව පෙනේ. ජීවිත රක්‍ෂණයට අදාළ වෛද්‍ය පරීක්‍ෂණයේදී වලිමුණිගෙන් පැහැදිළිව විමසා ඇත්තේ තමන් පසුගිය වසර පහ තුළ විශේෂඥ වෛද්‍යවරයකුගෙන් උපදෙස් ලබා ගත්තේද යන්නයි. වෛද්‍ය උපදෙස් මත ඉන්හේලර් යන්ත්‍රය භාවිත කළ නමුත් වලිමුණි රක්ෂණ සමාගමට දන්වා සිටියේ තමන් වෛද්‍ය උපදෙස් ලබා නොගත් බවයි. මෙහිදී වලිමුණි විසින් කරුණු වැරදි ලෙස නිරූපණය කිරීමක් සිදු කොට ඇති අතර වලිමුණිගේ ක්‍රියාකලාපය හේතුවෙන් උපරිම විශ්වාසය බිඳ වැටීමක් සිදුව ඇත. එබැවින් වලිමුණි සිදුකළ සාවද්‍ය ප්‍රකාශය මත රක්ෂණ සමාගමට වගකීම ප්‍රතික්ෂේප කළ හැකි අතර රක්ෂණ නීතියට අනුව එය සාධාරණීකරණය කළ හැකිය. ඒ අනුව වලිමුණිගේ බිරිඳට ජීවිත රක්ෂණ ආවරණය යටතේ වන්දි ඉල්ලා සිටීමට නීත්‍යානුකූල අයිතියක් නැත.

නඩු තීන්දු **-**

***Hooker V Law Union Insurance Company***

***(ලකුණු 06)***

**(b)**

- පළමු පක්ෂය

රක්ෂණ යෝජනාවක් ඉදිරිපත් කරන පුද්ගලයා හෙවත් රක්ෂණ ආවරණයක් ලබා ගන්නා පුද්ගලයා, 'රක්ෂිතයා' ලෙසද හැඳින්වේ.

aat SRI LANKA

- දෙවන පාර්ශවය

රක්ෂණ යෝජනාව පිළිගන්නා පාර්ශවය හෙවත් රක්ෂණ සමාගම, 'රක්ෂණකරු' ලෙසද හැඳින්වේ

- තෙවන පාර්ශවය

තුන්වන පාර්ශ්වය යනු ගිවිසුම ක්‍රියාත්මක කිරීමේදී පළමු සහ දෙවන පාර්ශ්වයෙන් බැහැරව රක්ෂණ ගිවිසුමට සම්බන්ධවන බාහිර පාර්ශ්වයන්වේ.

***(ලකුණු 04)***

***(මුළු ලකුණු 10)***

## ***තුන්වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තරඃ***

| ***පරිච්ඡේදය 07 -*** *කම්කරු නීතිය* |
|---|

**(a)**

1983 අංක 12 දරණ පාරිතෝෂිත ගෙවීම් පනත මගින් ප්‍රකාශිතව බැහැර නොකළ සෑම සේවකයෙකුටම ඔහුගේ හෝ ඇයගේ සේවා නියුක්තිය අවසන්කිරීමකදී පාරිතෝෂික සඳහා හිමිකම් ලැබිය යුතුය. පාරිතෝෂික සඳහා හිමිකම් ලැබීමට සේවකයෙකු එක් සේවායෝජකයෙකු සමඟ වසර පහක (5) සේවා කාලයක් සම්පූර්ණ කළ යුතුය. සේවා යෝජකයා සමඟ සම්පූර්ණ කරන ලද සේවා වර්ෂ ගණන සේවකයා විසින් ලබා ගන්නා අවසන් මාසයේ අඩ වැටුපෙන් ගුණ කිරීමෙන් ලැබෙන අගය පාරිතෝෂිතය ලෙස ලබා ගැනීමට සේවකයෙකුට අයිතිවාසිකම් ඇත.

$$\text{පාරිතෝෂිකය} = \frac{\text{අවසන් මාසයේ ලද මාසයේ වැටුප} \times \text{සම්පූර්ණ කළ සේවා වසර ගණන}}{2}$$

$$= \frac{200,000}{2} \times 5$$

$$= 500,000$$

ඒ අනුව රෝසිට රුපියල් 500,000/- ක පාරිතෝෂිකයක් සඳහා හිමිකම් කිව හැකිය.

***(ලකුණු 04)***

**(b)**

සේවකයෙකුට තම සේවක අර්ථසාධක අරමුදල ආපසු ලබා ගත හැක්කේ සේවක අර්ථසාධක අරමුදල් පනත මගින් නියම කර ඇති අවස්ථා වලදී පමණි. ස්ථිර පදිංචිය සඳහා වෙනත් රටකට යාම මත සේවක අර්ථසාධක අරමුදල ආපසු ලබා ගැනීමට සේවකයෙකුට අයිතිවාසිකමක් ඇත.එබැවින් රෝසිට තම සේවක අර්ථසාධක අරමුදලේ ඇති ශේෂය ලබා ගැනීමට නීත්‍යානුකූල අයිතියක් ඇත.

***(ලකුණු 03)***

SRI LANKA

(c)

1 සේවා යෝජකයින්ගෙන් අදාළ දායක මුදල් එකතු කිරීම.
2 සාමාජිකකයන් වෙනුවෙන් සාමාජික ගිණුම් පවත්වාගෙන යාම
3 සාමාජිකයින් විසින් හිමිකම් කියන අරමුදල් ගෙවීම
4 සාමාජිකයින්ගේ මෙම සුබසාධන අරමුදල් යෝජනා ක්‍රමය පරිපාලනය කිරීම
5 අඩුපාඩු හඳුනා ගැනීම, නීතිමය පියවර ගැනීම සහ දඬුවම් කිරීම
6 විවිධ ගණුදෙණු කළ හැකි උපකරණ මත අරමුදල් ආයෝජනය කිරීම.
7 සෑම වසරකම අවසානයේ සෑම සාමාජිකයෙකුටම ලාභාංශ ගෙවීම

*(ලකුණු 04)*

*(මුළු ලකුණු 10)*

## *හතරවන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර:*

| ***පරිච්ඡේදය 10*** - *ව්‍යාපාර පරිසරයට අදාල වැරදි* |
|---|

(a)

බුද්ධිමය දේපළ පනතේ 6 වැනි වගන්තියට අනුව, යම් කෘතියක කතුවරයාට එම කෘතිය සම්බන්ධයෙන් ප්‍රකාශන අයිතිය ඇත. නිර්මාණකරුවන්ගේ සම්භාව්‍ය, කලාත්මක සහ විද්‍යාත්මක කෘති සඳහා ලබා දී ඇති ආර්ථික හා සදාචාරාත්මක අයිතිවාසිකම් ප්‍රකාශන හිමිකම් ලෙස හැඳින්වේ.

ප්‍රකාශන හිමිකමක් දරන්නෙකුට, අදාළ බුද්ධිමය දේපළ ප්‍රතිනිෂ්පාදනය කිරීම, විකිණීම හෝ බදු දීම, බෙදා හැරීම, මහජනයාට පවරා දීම, කෘතිය පරිවර්තනය කිරීම යන ආර්ථික අයිතිවාසිකම් භුක්ති විඳින අතරම නිර්මාණකරුගේ ගෞරවයට හෝ කීර්තියට අගතියක් වන ආකාරයට එකී බුද්ධිමය දේපළ ඕනෑම විකෘති කිරීමකින් හෝ වෙනස් කිරීමකින් ආරක්ෂා කරගැනීමට සදාචාරාත්මක අයිතිවාසිකම් භුක්ති විඳිනු ඇත.සාමාන්‍ය රීතිය නම්, කෘතිය මහජනතාවට ඉදිරිපත් කළ දින සිට, කතුවරයාගේ මුළු ජීවිත කාලය පුරාමත්, කතුවරයාගේ මරණයෙන් පසු වසර හැත්තෑවක කාලයක් පුරාවටත් එකී කෘතිය පිළිබඳව බුද්ධිමය දේපළ අයිතාවාසිකමක් එම කතුවරයාට ඇත.

සුරේෂ්ගේ "හොඳ යහළුවෝ" පොත වෙනත් නමකින් ප්‍රකාශයට පත් කිරීමෙන් නිමල් බුද්ධිමය දේපළ සම්බන්ධ සදාචාරාත්මක අයිතිවාසිකම් කඩ කර ඇත. ඒ තුළ සුරේෂ්ට එම කෘතිය සම්බන්ධයෙන් හිමිවිය යුතු ගෞරවය, කීර්තිය අහිමිව ඇත. එසේම සුරේෂ්ගේ උරුමකරුවන්ට "හොඳ යහළුවෝ" පොත අලෙවි කොට ලාභ ලැබීමට ඇති හැකියාවක් වේ නම් එයටද බලපෑමක් එල්ල වේ.

නිමල්ගේ ක්‍රියාවෙන් සුරේෂ්ගේ බුද්ධිමය දේපළ අයිතිය උල්ලංඝනය වී ඇති බව පෙනෙන්නට ඇති බැවින්, බුද්ධිමය දේපළ පනත උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් සුරේෂ්ගේ උරුමකාරිය වන සුරේෂ්ගේ බිරිඳට නිමල්ට එරෙහිව නඩු පැවරිය හැකිය. ඇයට වසර 70ක් පුරාවට "හොඳ යහළුවෝ"

aat SRI LANKA

පොත සම්බන්ධයෙන් ආර්ථික හා සදාචාරාත්මක අයිතියක් භුක්ති විදීමට අයිතාවාසකම් ඇත.

***(ලකුණු 06)***

**(b)**

- බුද්ධිමය දේපල සම්බන්ධ නීති සම්පාදනය කිරීම
- ලියාපදිංචිය පාලනය සහ පරිපාලනය සඳහා කාර්යක්ෂම ක්‍රියා පටිපාටියක් ලබා දීම
- ශ්‍රී ලංකාවේ බුද්ධිමය දේපළ පිළිබඳ අධ්‍යක්ෂ ජනරාල්වරයෙක් පත් කිරීම
- රේගු ආඥාපනත සහ පළාත් විශේෂ විධිවිධාන පනත සංශෝධනය කිරීම

***(ලකුණු 04)***

***(මුළු ලකුණු 10)***

## *පස්වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තරː*

| |
|---|
| ***පරිච්ඡේදය 05 -** සමාගම් සහ හවුල් ව්‍යාපාර නීතිය* |

**(a)**

<u>ව්‍යාපාරයක පැවැතීම</u>

18900 හවුල් ආඥා පනතේ 45 වැනි වගන්තිය අනුව ඕනෑම වෙළදාමක්, රැකියාවක් හෝ වෘත්තියක් හවුල් ව්‍යාපාර ආකෘතියෙන් පවත්වා ගත හැකිය. මෙම නිර්වචනය අනුව පෙනී යන්නේ හවුල් ආඥාපනත මගින් හවුල් ව්‍යාපාර ආකෘතියෙන් සිදු කළ හැකි වාණිජ කටයුතු සම්බන්ධයෙන් සීමා පනවා නොමැති බවයි.

කෙසේ වෙතත්, මූල්‍ය වෙළෙඳපොළ රෙගුලාසිවලට අනුව, බැංකු ව්‍යාපාරයක්, රක්ෂණ ව්‍යාපාරයක් හෝ මූල්‍ය ආයතනයක් හවුල් ව්‍යාපාරයක් ලෙස ක්‍රියාත්මක කළ නොහැක. හවුල් ව්‍යාපාරයක් ලෙස හඳුනා ගැනීමට නම් ව්‍යාපාරයකට අඛණ්ඩ පැවැත්මක් තිබිය යුතු බව හවුල් ආඥා පනතේ වැඩිදුරටත් සඳහන් වේ.

උදාහරණයක් ලෙස, මෝටර් සයිකලයක් නැවත විකිණීමේ අරමුණින් මිලදී ගැනීම සහ අලුත්වැඩියා කිරීම සඳහා පුද්ගලයන් දෙදෙනෙකු අතර ඇති ගිවිසුම අඛණ්ඩ පැවැත්මක් නොමැති බැවින්, එයින් ලැබෙන ලාභය බෙදා හැරි පමණින් එය හවුල් ව්‍යාපාරයක් බවට පත් නොවේ.

<u>පුද්ගලයන් දෙදෙනෙකු හෝ වැඩි ගණනකගේ සම්බන්ධතාවයක් පැවතීම</u>

හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන යාමට අවම වශයෙන් පුද්ගලයන් දෙදෙනෙකු සිටිය යුතු අතර හවුල් ආඥාපනත යටතේ උපරිම හවුල්කරුවන් සංඛ්‍යාව සීමා නොකෙරේ. නමුත් 2007 අංක 07 දරන සමාගම් පනතේ 519 වගන්තිය යටතේ හවුල් ව්‍යාපාරයක සිටිය හැකි උපරිම හවුල්කරුවන් සංඛ්‍යාව හවුල්කරුවන් විසි දෙනෙකුට සීමා වේ.

ලාභ අරමුණ

හවුල් ව්‍යාපාරයක අරමුණ ලාභය විය යුතුය. හවුල් ව්‍යාපාර සමිති සහ සංගම් වලින් වෙනස් වන්නේ එවැනි සංවිධානවල ලාභ චේතනාවක් නොමැති බැවිනි

එකගතාවයක් පැවතීම

හවුල් ව්‍යාපාරයක හවුල්කරුවන් අතර පොදුවේ ව්‍යාපාරයක් කරගෙන යාමට සහ ඔවුන් අතර ලාභ අලාභ බෙදා ගැනීමට එකඟතාවක් තිබිය යුතුය. හවුල් යාපාරයේ ලාභයෙන් කොටසක් ලැබූ පමණින් හවුල්කරුවෙකු නොවන අතර හවුල් එකගතාවයේ පාර්ශවකරුයෙකු විය යුතුය.

***(ලකුණු 06)***

**(b)**

පහත ක්‍රියාවන්හි නිරත වීමට ඕනෑම හවුල්කරුවෙකුට ව්‍යංග බලයක් ඇත.

- හවුල් ව්‍යාපාරයේ භාණ්ඩ විකිණීමට
- හවුල් ව්‍යාපාරයේ ද්‍රව්‍ය විකිණීමට
- හවුල් ව්‍යාපාරයේ ණය අයකර ගැනීමට සහ ඔවුන් සඳහා රිසිට්පත් නිකුත් කිරීමට
- හවුල් ව්‍යාපාරය සඳහා සේවකයින් බඳවා ගැනීමට

***(ලකුණු 04)***

***(මුළු ලකුණු 10)***

## *හයවන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තරඃ*

***පරිච්ඡේදය 04*** - *නියෝජ්‍යත්ව නීතිය*

**(a)**

ප්‍රශ්නගත අවස්ථාවට අනුව, සරත් සහ කපිල අතර නියෝජ්‍යත්ව සම්බන්ධතාවය "ප්‍රකාශිත නියෝජ්‍යත්වය" වේ. මෙහිදී නියෝජිතයෙකු සෘජුව පත් කිරීමක් සිදුවේ. මෙහිදී සරත් පැහැදිලිවම කපිලව කුකුළු ගොවිපලේ කළමනාකරු ලෙස පත් කර ඇත.

***(ලකුණු 03)***

**(b)**

මෙම තත්ත්වය " ව්‍යංග නියෝජ්‍යත්වය"ට අදාළ මූලධර්ම මගින් පැහැදිලි කළ හැකිය. ප්‍රධානියෙකු විසින් යම් තනතුරක් හෝ කාර්යයක් සඳහා පුද්ගලයෙකු නම් කර ඇති අවස්ථාවක, එම තනතුරේ හෝ කාර්යයයේ යම් කොටසක් ක්‍රියාත්මක කිරීමට අවශ්‍යවන්නා වූ යම් බලතලයක් නියෝජිතයා වෙත ප්‍රකාශිතව ලබා දී නොමැති වුවද, එම තනතුරේ හෝ කාර්යයේ හෝ සිරිත් විරිත් සහ ඒ හා සම්බන්ධ පරිචයන් අනුව, ඔහුගේ ප්‍රධානියා වෙනුවෙන් ක්‍රියා කිරීමට ස්භාවිකව ලැබෙන බලය ව්‍යංග අධිකාරිය ලෙස සලකනු ලැබේ.

SRI LANKA

කපිල කුකුළු ගොවිපළේ කළමනාකරු ලෙස පත්කොට ඇත. ව්‍යාපාරයයේ කළමනාකරු ලෙස කපිලට එම තනතුරේ වගකීම් ඉටු කිරීමට අවශ්‍ය එවැනි ක්‍රියාකාරකම්වල යෙදීමේ ව්‍යංග බලයක් ඇත. ඒ අනුව ප්‍රකාශිතව ලබා දී ඇති අධිකාරී බලයක් නොමැති වුවද ගොවිපළ සඳහා කුකුල් ආහාර මිලදී ගැනීමේ ව්‍යංග බලයක් කපිලට තිබේ.

*__Hely-Huchinson__* V *__Brayhead Ltd__* නඩුවේදී, සමාගමක කළමනාකාර අධ්‍යක්ෂවරයාට බාහිර පාර්ශවයන් වෙනුවෙන් ඇපවීමේ ප්‍රකාශිත බලයක් ලබා දී නොතිබුණද, ඔහු සමාගමෙහි දැරූ තනතුර අනුව, ඔහුට එවැනි ඇපවීමක් සිදුකිරීමට ව්‍යංග අධිකාරියක් පවතින බව අධිකරණය විසින් ප්‍රකාශ කොට ඇත.

කපිල කුකුල් ආහාර මිල දී ගැනීම සඳහා තම තනතුරේ ව්‍යංග බලය භාවිතා කර ඇති බැවින්, ඔහුගේ ප්‍රධානියා වන සරත් කුකුල් ආහාරවල වටිනාකම මොහොමඩ්ට ගෙවීමට බැඳී සිටී.

*(ලකුණු 04)*

**(C)**

නියෝජිතයෙකුගේ ප්‍රධාන යුතුකම්වලින් එකක් ලෙස, නියෝජිතයා විසින් ප්‍රධානියාගේ උපදෙස් අනුගමනය කළ යුතු අතර නියෝජිතයා ඔහුට පැවරී ඇති අධිකාරිය ඉක්මවා කටයුතු නොකළ යුතුය. ප්‍රශ්නගත සිදුවීමේදී කපිලට (නියෝජිතයා) 'කිසිම අවස්ථාවක බිත්තරයක් රුපියල් 55/- ට අඩු මිලකට අලෙවි නොකරන ලෙසට ප්‍රධානියා වන සරත් උපදෙස් ලබා දී ඇත. කෙසේ වෙතත්, කපිල බිත්තර 1,000ක් රුපියල් 52/-කට රාජාට විකුණු අතර, බොහෝ බිත්තර හොඳ තත්ත්වයේ නැති බව රාජාට පසුව අවබෝධ විය. කපිල දුන් උපදෙස් පිළිපැදීමට අපොහොසත් වූ බැවින් රාජාට සරත්ගෙන් වන්දි ඉල්ලා සිටීමට නොහැකි වනු ඇත. එය ගෙවිය යුත්තේ කපිල විසිනි.

*(ලකුණු 04)*

*(මුළු ලකුණු 10)*

***B කොටසෙහි අවසානය***



aat SRI LANKA

## හත්වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තරඃ

*පරිච්ඡේදය 02 - ගිවිසුම් නීතිය*

**(A)(a)**

"අර්පණයක්" යන්න සරල වචන වලින් අර්ථ දැක්විය හැක්කේ එක් පාර්ශ්වයක් තවත් පාර්ශවයක් සමඟ ගිවිසුමක් ඇති කර ගැනීමේ සදහා කැමැත්ත ප්‍රකාශ කිරීමක් ලෙස ය. නීත්‍යානුකූලව එය අර්පණකරු විසින් අර්පණලාභියාට ලබා දෙන නිශ්චිත කොන්දේසි මත බැඳී සිටීමේ නිශ්චිත පොරොන්දුවක් ලෙස අර්ථ දැක්විය හැක. අර්පණය ලිඛිතව, වාචිකව හෝ ව්‍යංගයෙන් ඉදිරිපත් කළ හැකිය.

වලංගු අර්පණයක ප්‍රධාන අංග පහත දැක්වේ.

- අර්පණය නිශ්චිත සහ ස්ථිර විය යුතුය.
- අර්පණය කළ යුත්තේ එයට බැඳී සිටීමේ අදහසිනි
- අර්පණය බලාත්මක වන්නේ එය අර්පණලාභියාට සන්නිවේදනය වීමෙන් පසුව පමණි

ජනවාරි 08 වැනි දින හොරණ ප්‍රදේශයේ පදිංචි කහතුඩුව නමැති කහ සැපයුම්කරුවෙකුට කතා කළ අජ්සාරි, ශ්‍රී ලංකා කහ කිලෝග්‍රෑම් 500ක් කිලෝග්‍රෑමයකට රුපියල් 5,000/- බැගින් ලබා දෙන ලෙසට අර්පණය කළාය.

මෙම වාචික සන්නිවේදනය වලංගු අර්පණයක සියලුම අවශ්‍යතා පැහැදිලිව සපුරාලන බව පෙනේ. බැඳී සිටීමේ චේතනාවක් ද අඩංගු වන අතරම එය පැහැදිලි සහ නිශ්චිත ය. එබැවින් අජ්සාරිගේ දුරකථන ඇමතුම කහතුඩුවට සිදු කළ වලංගු අර්පණයක් ලෙස සැලකිය හැකිය.

*(ලකුණු 03)*

**(b)**

මෙම කාරණය සම්බන්ධයෙන් ගිවිසුම්වලට අදාළ තැපැල් මාර්ගික ප්‍රතිග්‍රහණයට අදාළ මූලධර්ම බලපායි.

සාමාන්‍ය රීතිය වන්නේ ප්‍රතිග්‍රහණය බලාත්මක වන්නේ එය අර්පණලාභියාට නිල වශයෙන් සන්නිවේදනය වීමෙන් පසුව බවයි. අර්පණය සම්පූර්ණ වන්නේ අර්පණය අර්පණලාභියාට දැනුම් දීමෙන් පසුව පමණි.

කෙසේ වෙතත් තැපැල් මාර්ගික ගිවිසුම් සාමාන්‍ය රීතියට ව්‍යතිරේකයකි.

ප්‍රතිග්‍රණය තැපැල් මගින් සිදු කිරීමට පාර්ශ්වයන් ප්‍රකාශිතව හෝ ව්‍යංගයෙන් එකඟ වී ඇත්නම් පමණක් තැපැල් මාර්ගිකව ප්‍රතිග්‍රහණය කළ හැකිය, තැපැල් මාර්ගික ගිවිසුම්වලට අදාළ රීතිය

වන්නේ ලිපිය ප්‍රමාද වීමක් හෝ තැපෑලේදී නැති වූවත් පිළිගැනීමේ ලිපිය තැපැල් කළ අවස්ථාවේදී ප්‍රතිග්‍රහණය සම්පූර්ණ වීමයි.

මෙම න්‍යාය **Adams** V **Lindsay** න්‍යාය ලෙසද හැදින්වේ

මෙම අවස්ථාවේ දී අප්සාරි කහතුඩුවගෙන් ශ්‍රී ලංකා කහ කිලෝග්‍රෑම් 500 ක් රු. 5,000/- බැගින් මිලදී ගැනීමට අර්පණය අතර ප්‍රතිග්‍රහණය තැපැල් මගින් සිදු කිරීමටද ද එකඟ වී ඇත. ජනවාරි 10 වෙනිදා උදේ කහතුඩුව අප්සාරි වෙත සිය ප්‍රතිග්‍රහණ ලිපිය තැපැල් කරමින් ප්‍රකාශ කර ඇත්තේ අප්සාරි විසින් ඉල්ලා සිට මිලට එම ප්‍රමාණය සැපයීමට තමන් සූදානම් බවයි. ලිපිය ජනවාරි 13 වන දින අප්සාරිගේ කාර්යාලයට ලැබී ඇත. අප්සාරිට 13 වන දින ලිපිය ලැබුණද තැපැල් රීතිය ක්‍රියාත්මක වීමෙන් දෙපාර්ශ්වය අතර වලංගු ගිවිසුමක් උද්ගතව ඇත්තේ 10 වැනිදා බව පෙනේ. ඒ අනුව කවර හෝ කාරණයක් මත කහ මිලදී ගැනීම ප්‍රතික්ෂේප කරමින් අප්සාරි සිදු කොට ඇත්තේ ගිවිසුම කඩකිරීමක්ය.

ගිවිසුම කඩ කිරීම සම්බන්ධයෙන් අප්සරිට නඩු පැවරීමට කහතුඩුවට අයිතියක් ඇත.

විකල්ප නඩු තීන්

*Ceylon University* V *Fernando*
*Household Fire Carriage and Accident Insurance Company* V *Grant*

***(ලකුණු 06)***

**(c)**

ඒකපාර්ශ්වික ගිවිසුම් පිළිබඳ සංකල්පය මෙම කාරණයට අදාළ වේ.

සාමාන්‍ය රීතිය වන්නේ ප්‍රතිග්‍රහණය බලාත්මක වන්නේ එය අර්පණලාභියාට නිල වශයෙන් දැනුම් දීමෙන් පසුව බවයි. කෙසේ වෙතත් ඒකපාර්ශ්වික ගිවිසුම් සාමාන්‍ය රීතියට ව්‍යතිරේකයකි.

අර්පණකරු විසින් යම් කාරණයක් සම්බන්ධයෙන් සෘජුව ක්‍රියා කිරීමට අර්පණලාභියාට බලය ලබා දෙන්නේ නම්, එවැනි තත්වයක් තුළ, ප්‍රතිග්‍රහණය සන්නිවේදනය කිරීමේ නීතිමය උපචාරය නොසලකා අර්පණලාභීයා විසින් අර්පණකරුගේ උපදෙස් අනුව කටයුතු කොට ඇත්නම් එම ක්‍රියාව සමග ප්‍රතිග්‍රහණයක් සංස්ථාපනය වේ.

ශ්‍රීමත් C.J වීරමන්ත්‍රී මහතා සිය ග්‍රන්ථය තුළ මෙම තත්වය LJ Bowen ගේ අදහසක් උපුටා දක්වමින් මෙසේ පැහැදිලි කොට ඇත. එම මහතා නැතිවූ බල්ලෙකු පිළිබඳ දැන්වීමක් දුටු පුද්ගලයෙකු තමා බල්ලා සොයා යන බවට අයිතිකරුට දැනුම් දිය යුතුද යන්න ප්‍රශ්න කොට ඇත. ඉතා පැහැදිලිව එවැනි තත්වයක් තුළ ඔහු බල්ලා සොයා යන බව දැනුම් දීම අවශ්‍ය නොවේ. එවැනි තත්වයක් තුළ, ප්‍රතිග්‍රහණය සිදුවනු ඇත්තේ බල්ලා සොයා ගැනීමෙනි. වැනි ගිවිසුම් ඒකපාර්ශ්වික ගිවිසුම් ලෙස හැඳින්වේ.

ඉහත න්‍යාය ***Carlill v Carbolic Smoke Ball Co*** හි ද සාකච්ඡා කෙරේ.

Carbolic Smoke Ball සමාගම තම දුම් බෝල නැමති තම නිෂ්පාදිතය නියමිත පරිදි භාවිතා කිරීමෙන් පසු ඉන්ෆ්ලුවෙන්සා නොවැළදෙන බවත් එසේ භාවිතාකිරීමෙන් අනතුරුව ඉන්ෆ්ලුවෙන්සා වැළදෙන යම් අයෙක් වේ නම් ඔහුට හෝ ඇයට පවුම් 100 ක ත්‍යාගයක් ගෙවීමට සූදානම් බවත් පචාරණය කරන ලදී. නියමිත පරිදි දුම් බෝල නැමැති නිෂ්පාදිතය භාවිතා කිරීමෙන් පසුව පවා කාලිල් මහත්මියට ඉන්ෆ්ලුවෙන්සා වැළඳුණි. ඇයට හිමිවිය යුතු පවුම් 100 සමාගමෙන් ඉල්ලා සිටියත් සමාගම එය ප්‍රතික්ෂේප කළ නිසා ඇය විසින් සමාගමට එරෙහිව නඩු පවරා සිටියාය. එම නඩුවේදී සමාගමේ තර්කය වූයේ මෙය මුලුමහත් ලෝකයටම විවෘතව ඉදිරිපත් කළ යෝජනාවක් බවත් ඇය එම යෝජනාව පිළිගැනීමේ දැන්වීමක් සමාගම වෙත සිදු කර නැති බවත්ය.

මෙම ගිවිසුම ස්භාවය අනුව ඒකපාර්ශවික ගිවිසුමක් බවත්. නියමිත පරිදි දුම් බෝල භාවිතා කරමින් කාර්ලිල් මහත්මිය මෙම අර්පණය ප්‍රතිග්‍රහණය කොට ඇති බවත්, එබැවින් ඇයට පවුම් 100 ක ත්‍යාගය ගෙවීමට සමාගම බැඳී සිටින බවත් අධිකරණය මෙහිදී ප්‍රකාශ කරන ලදී.

මෙම අවස්ථාවෙහිදී, “කහ-ආලේප” භාවිතයෙන් ඇතිවන ගැටලුකාරී තත්වයකදී කියන ඕනෑම පුද්ගලයෙකුට රු. 100,000/- ත්‍යාගයක් ගෙවනු ලබන බවට අප්සාරි සිදු කළ පුවත්පත් දැන්වීම සමස්ත ලෝකයටම විවෘතව කරන ලද අර්පණයක් ලෙස හඳුනාගත හැකිය. එවැනි අර්පණයක් ලෝකයේ සිටින ඕනෑම පුද්ගලයෙකු වෙත කරන ලද අර්පණයක් ලෙස සැලකේ. එබැවින් මෙම දීඅර්පණය ඕනෑම කෙනෙකුට පිළිගත හැකිය. මෙම අවස්ථාවෙහිදී, “කහ-ආලේප” භාවිතයෙන් ඇතිවන ගැටලුකාරී තත්වයකදී කියන ඕනෑම පුද්ගලයෙකුට රු. 100,000/- ත්‍යාගයක් ගෙවනු ලබන බවට අප්සාරි සිදු කළ පුවත්පත් දැන්වීම සමස්ත ලෝකයටම විවෘතව කරන ලද අර්පණයක් ලෙස හඳුනාගත හැකිය. එවැනි අර්පණයක් ලෝකයේ සිටින ඕනෑම පුද්ගලයෙකු වෙත කරන ලද අර්පණයක් ලෙස සැලකේ. එබැවින් මෙම දීඅර්පණය ඕනෑම කෙනෙකුට පිළිගත හැකිය. මෙවැනි අර්පණයක් පිළිගැනීම සිදු කරනු ලබන්නේ හුදෙක් අර්පණය මත මත ක්‍රියා කිරීමෙන් වන අතර, ප්‍රතිග්‍රහණය අර්පණකරුට විශේෂයෙන් සන්නිවේදනය කිරීමට අවශ්‍ය නොවේ. එබැවින් ප්‍රශ්නගත සිදුවීමේදී, අප්සාරි විසින් සිත්තර-ගුරුන්නාන්සේට වලංගු අර්පණයක් කර ඇති බැවින් සහ සිත්තර-ගුරුන්නාන්සේ විසින් නියමිත ආකාරයට පන්සලේ බිතුසිතුවම් සඳහා "කහ-ආලේප" භාවිතා කරමින් මෙම අර්පණය පිළිගෙන ඇත. එබැවින් අප්සාරි සහ සිත්තර-ගුරුන්නාන්සේ අතර වලංගු ගිවිසුමක් පවතී. ඒ අනුව “කහ-ආලේප” භාවිතය නිසා සිදුවන ඕනෑම අලාභයක් සඳහා වන්දි ලබාගැනීමට ගිවිසුමේ සඳහන් පරිදි සිත්තර-ගුරුන්නාන්සේට අයිතියක් ඇත.

***(ලකුණු 06)***

**(B)**

***පරිච්ඡේදය 03** - භාණ්ඩ විකිණීමේ නීතිය*

**(a)**

භාණ්ඩ විකිණීමේ ආඥාපනතේ ව්‍යංග කොන්දේසිවලට අදාළ විධිවිධාන අනුව අදාළ සිද්ධිය අර්ථකථනය කළ හැකිය.

භාණ්ඩ විකිණීමේ ආඥාපනතට අනුව, නියැදියක් මෙන්ම විස්තරයක් මගින් භාණ්ඩ විකිණීමක් සිදුකොට තිබේ නම්, භාණ්ඩ විස්තරය සමඟ පමණක් නොව, දී ඇති නියැදිය සමඟද අනුරූප විය යුතුය.

**K-Super** බිත්තර 10,000ක් මිලදී ගැනීමට උත්තර-බිත්තර ලිමිටඩ් (**UB)** සමඟ ගිවිසුමකට එළඹුණු අතර ගිවිසුමට එළඹීමට පෙර K-Super නියැදියක් පරීක්ෂා කළේය. සීමාසහිත උත්තර-බිත්තර සමාගම විස්තර කළේ මෙම බිත්තර ඉන්දියාවෙන් ආනයනය කළ බවයි. **K-Super** හි ගබඩා භාරකරු විසින් පෙන්වා දෙන ලද සාම්පලවලට සමාන බිත්තර 6,000 ක් පමණක් පවතින අතර ඉතිරි බිත්තර තොග ඉන්දියාවෙන් ආනයනය කරන ලද ඒවා නොවේ.

මෙමගින් සීමාසහිත උත්තර-බිත්තර සමාගම භාණ්ඩ විකිණීමේ ආඥාපනතේ 14 වැනි වගන්තිය උල්ලංඝනය කළේය. එබැවින්, **K-Super** සීමාසහිත උත්තර-බිත්තර සමාගමට එරෙහිව භාණ්ඩ විකිණීමේ ගිවිසුමක ව්‍යංග වගන්ති කඩ කිරීම සම්බන්ධයෙන් නීතිමය පියවර ගත හැකිය.

***(ලකුණු 06)***

aat
SRI LANKA

**(b)**

පළමු රීතිය

භාණ්ඩ විකිණීමේ ගිවිසුමේ විෂය වස්තුව වන භාණ්ඩ භාර දිය හැකි තත්වයේ නිශ්චිත භාණ්ඩ නම්ල හා අදාළ ගිවිසුම කොන්දේසි විරහිත එකක් නම් ගිවිසුමට එළඹි වහාම භාණ්ඩවල අයිතිය විකුණුම්කරුගෙන් ගැණුම්කරුට මාරු වේ.

දෙවන රීතිය

භාණ්ඩ විකිණීමේ ගිවිසුමේ විෂය වස්තුව වන භාණ්ඩ භාර දිය නොහැකි තත්වයේ නිශ්චිත භාණ්ඩ නම්ල ඒවා භාර දිය හැකි තත්වයට පත් කිරීමට බැඳී සිටින්නේ විකුණුම්කරු විසින් නම්ල විකුණුම්කරු ඒවා භාර දිය හැකි තත්වයට පත් කොට ගැණුම්කරුට දන්වන තෙක් භාණ්ඩවල අයිතිය ගැණුම්කරුට මාරු නොවේ.

තෙවන රීතිය

භාණ්ඩ විකිණීමේ ගිවිසුමේ විෂය වස්තුව වන භාණ්ඩ භාර දිය හැකි තත්වයේ නිශ්චිත භාණ්ඩ වුව ද ඒවායේ මිල නියම කිරීමේ කාර්යය සඳාහා විකුණුම්කරු විසින් කිරීමල මැනීම හෝ වෙනත් යම් ක්‍රියාවක් හෝ දෙයක් කළ යුතු වන විටකල විකුණුම්කරු එය සිදු කොට ගැණුම්කරුට දන්වන තෙක්

භාණ්ඩවල අයිතිය විකුණුම්කරුගෙන් ගැණුම්කරුට මාරු නොවේ. කෙසේ නමුත් භාණ්ඩවල මිල නියම කිරීම සඳාහා ඒවා කිරීම්ල මැනීම් හෝ වෙනත් යම් පරීක්ෂණ කළ යුතු වන්නේ ගැණුම්කරු විසින්වන විටක මෙම තෙවන රීතිය අදාළ නොවන අතර අදාළ වන්නේ පළමු රීතිය යි.

සිව්වන රීතිය

භාණ්ඩ විකිණීමේ ගිවිසුමේ විෂය වස්තුව වන භාණ්ඩ ගැණුම්කරුගේ ණීඅනුමැතියට යටත්ව ණී හෝ ණීවිකිණීමේ හෝ ආපසු ගෙවීමේ පදනම ණී මත හෝ වෙනත් ඒ හා සමාන නියමයක් යටතේ ගැණුම්කරුට භාණ්ඩ භාර දී ඇති විටෙක එකී භාණ්ඩවල අයිතිය ගැණුම්කරුට මාරුවන්නේ පහත සඳාහන් අවස්ථාවන් යටතේ ය.

■ගැණුම්කරුගේ අනුමැතිය හෝ පිළිගැනීම විකුණුම්කරුට දැන් වූ විට හෝ ගනුදෙනුව පිළිගන්නා වූ හෝ වෙනත් යම් ක්‍රියාවක් කළ විට (එම භාණ්ඩ වෙනත් අයෙකුට විකිණීම හෝ උකස් කිරීම වැනි ක්‍රියාවක් කිරීමෙන්)

■ගැණුම්කරු තමාගේ අනුමැතිය හෝ පිළිගැනීම විකුණුම්කරුට දැන්වීමක් නොකර භාර නොගන්නේ නම්ල භාණ්ඩ ආපසු භාරදිය යුතු යැයි නියම කර ඇති නිශ්චිත වේලාවක් ඇත්නම්ල එය ඉක්මවන තෙක් හෝ එසේ නිශ්චිත වේලාවක් නියම කර නැති විටෙකල සාධාරණ කාලසීමාවක් ඉක්මවන තෙක්ල එම භාරයට තබා ගෙන සිටි විටෙක.

***(ලකුණු 05)***

***(මුළු ලකුණු 25)***

SRI LANKA

***C කොටසෙහි අවසානය***

## *Notice:*

These answers compiled and issued by the Education and Training Division of AAT Sri Lanka constitute part and parcel of study material for AAT students.

These should be understood as Suggested Answers to questions set at AAT Examinations and should not be construed as the "Only" answers, or, for that matter even as "Model Answers". The fundamental objective of this publication is to add completeness to its series of study texts, design especially for the benefit of those students who are engaged in self-studies. These are intended to assist them with the exploration of the relevant subject matter and further enhance their understanding as well and stay relevant in the art of answering questions at examination level.

*© 2021 by the Association of Accounting Technicians of Sri Lanka (AAT Sri Lanka). All rights reserved. No part of this document may be reproduced or transmitted in any form or by any means, electronic, mechanical, photocopying, recording or otherwise without prior written permission of the Association of Accounting Technicians of Sri Lanka (AAT Sri Lanka)*